සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ව්‍යවසායකත්ව අධ්‍යයනය

10 ශ්‍රේණිය | කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01 පවතින දේ පිළිබඳව විමසිලිමත් වෙමින් වෙනසක් කිරීමට උත්සහ දරන පුද්ගලයින් වනුයේ,
(1) පාරිභෝගිකයින් (2) නිෂ්පාදකයින් (3) ව්‍යවසායකයින් (4) කළමනාකරුවන්

02 ව්‍යවසායකත්ව සංකල්පය පැහැදිලි කිරීමට අදාළ කරගත නොහැකි වගන්තිය වනුයේ,
(1) මිනිස් චින්තනය හා සම්බන්ධ වූ හැඟීම් හා ඒ අනුව ක්‍රියා කරන හා හැසිරෙන ආකාරයකි.
(2) පරිසරයේ ඇති අවස්ථා හඳුනාගෙන නවෝත්පාදනය බිහි කරන්නෙකි.
(3) අවදානම් භාර ගැනීමට ඉදිරිපත් නොවන්නෙකි.
(4) සහජයෙන් උරුම විය හැකි මෙන්ම අධ්‍යාපනය හා පළපුරුද්ද තුළින් සකස් කර හැකි දෙයකි.

03 ව්‍යවසායකයා ව්‍යාපාර අදහසක් සංවර්ධනය කිරීමට අවශ්‍ය සම්පත් සපයාගෙන එය යෙදවීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජයට බිහිකරනුයේ,
(1) හොඳ කළමනාකරුවන් ය. (2) භාණ්ඩ හා සේවාය.
(3) අයිතිකරුවන් ය. (4) හොඳ පාරිභෝගිකයන් ය.

04 නිෂ්පාදන කාර්ය සඳහා විවිධ සම්පත් අවශ්‍ය වේ. මෙම සම්පත් නිෂ්පාදන සාධක වශයෙන් හැඳින්වෙන අතර එම සාධක පමණක් ඇතුළත් වන්නේ,
(1) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය ලෙසය.
(2) භූමිය, ශ්‍රමය, ඉඩම්, ගොඩනැගිලි ලෙසය.
(3) භූමිය, ශ්‍රමය, උපකරණ හා ප්‍රාග්ධනය ලෙසය.
(4) භූමිය, ශ්‍රමය, ඉඩම් හා ගොඩනැගිලි, ව්‍යවසායකත්වය ලෙසය

05 ව්‍යවසායකත්ව ගති ලක්ෂණ පමණක් ඇතුළත් වන කාණ්ඩය වනුයේ,
(1) නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය, පරිසරය සංවේදී නොමැතිකම
(2) නිර්මාණශීලීත්වය, ස්වාධීනත්වය, අසුභවාදී බව, අනාගත දැක්ම
(3) පහසු අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි ඇති නැඹුරුව, නවෝත්පාදනය, නිර්මාණශීලීත්වය, අනාගත දැක්ම
(4) නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය, අවදානම් භාරගැනීම, අනාගත දැක්ම

06 තිමිරගේ ව්‍යාපාරය පිහිටි නගර ස්ථානය දිවා මෙන්ම රාත්‍රියේ ද ඒකාකාරී ස්වභාවයෙන් ජනයා ගැවසෙන නගරයක් වුවද, තිමිර තම වෙළඳසැල දිවා කාලයට පමණක් විවෘතව තබන අතර රාත්‍රී කාලයට ව්‍යාපාරය වසාදමයි. මෙම තත්ත්වය තිමිරගේ ව්‍යාපාරයේ නිර්මාණශීලීත්වයට බාධාකාරී වන කුමන සාධකයට අයත්වේ ද?
(1) විශ්වාසය හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම.
(2) යම් ගැටලුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම.
(3) රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළිපැදීම.
(4) වැරදීම් හා විවේචනවලට ඇති බය

07 ව්‍යවසායකයා නවෝත්පාදනයේ යෙදෙන විට එහි අවදානමක් පවතී. මෙම අවදානම සම්බන්ධ නිවැරදි නොවන ප්‍රකාශය වනුයේ,
(1) අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ද ඉහළ වේ.
(2) අවදානම පහළ නම් ප්‍රතිලාභය ද ඉහළ වේ.
(3) අවදානම පහළ නම් ප්‍රතිලාභය ද පහළ වේ.
(4) ප්‍රතිලාභය ඉහළ නම් අවදානම ද ඉහළ වේ.

08 අ.පො.ස (උ/පෙළ) ලියා අවසන් කළ සුජානි රැකියාවක් සොයන අතර තුර රාත්‍රී ආහාර අළෙවි සැලක් ආරම්භයට යොමුවූවාය. ඇය ව්‍යවසායිකාවක් ලෙස නවෝත්පාදනයට යොමු වූයේ කුමන කරුණක් මතද?
(1) නව සොයාගැනීමක් ලෙසය.
(2) අවදානම භාරගැනීමක් ලෙසය.
(3) පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනාගැනීමක් ලෙසය.
(4) ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බවට ඇති විශ්වාසය මතය.

09 ව්‍යාපාර ආරම්භවීමට බලපෑ මූලික සාධකය වනුයේ,

(1) භාණ්ඩ හා සේවාය (2) අවශ්‍යතා හා වුවමනාය

(3) භාණ්ඩ නිෂ්පාදනයය (4) ලාභ ලැබීමේ චේතනාවය

10 ''ව්‍යාපාර'' යන්නෙහි අර්ථය වඩා හොඳින් ප්‍රකාශ වන්නේ,

(1) ලාභ ලැබීමේ අරමුණින් කරන ඕනෑම කටයුත්තකි.

(2) මිලදී ගැනීම් හා විකිණීම් සම්බන්ධ වූ ඕනෑම කටයුත්තකි.

(3) භාණ්ඩ හා සේවා හුවමාරුව සම්බන්ධ ඕනෑම කටයුත්තකි.

(4) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමේ ඕනෑම කටයුත්තකි.

11 මිනිසාට ජීවත්වීමට ශාරීරිකව හා මානසිකව අනිවාර්යයෙන් ඉෂ්ඨ කර ගත යුත්තේ,

(1) වුවමනාය (2) අවශ්‍යතාය

(3) අවශ්‍යතා හා වුවමනාය (4) මේ සියල්ලම ය

12 තම ආශාවන් තෘප්තිමත් කර ගැනීමට කැමැත්තක් දක්වන විවිධ ස්වරූප හැඳින්වෙන්නේ,

(1) පරිභෝජනය ලෙසය. (2) නිෂ්පාදනය ලෙසය.

(3) අවශ්‍යතා ලෙසය. (4) වුවමනා ලෙසය.

13 භාණ්ඩ හා සේවා අතර වෙනස හඳුනාගත හැක්කේ,

(1) ඉල්ලුම මතය (2) සැපයුම මතය

(3) ස්පෘශ්‍යතාවය මතය (4) පරිභෝජනය මතය

14 සෑම ව්‍යාපාරිකයකුම ව්‍යවසායකයකු වන්නේ ද, සෑම ව්‍යවසායකයකුම ව්‍යාපාරිකයකුද වන්නේ නැත. වෙනස හඳුනාගැනීමේ දී ව්‍යාපාරිකයකු සතු ලක්ෂණයක් විය හැක්කේ,

(1) ඉතා ආසන්න ඉලක්ක ඇතිකර ගැනීම.

(2) තරගය කැමැත්තෙන් සොයා යයි.

(3) පවතින සම්පත් අවශ්‍යතාවලට අනුව උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම.

(4) ගැටලු නිර්මාණශීලීව විසඳයි.

15 අපට එදිනෙදා හමුවන සිල්ලර වෙළඳ ව්‍යාපාරිකයා අයත්වන්නේ කුමන ව්‍යවසායක වර්ගයට ද?

(1) ආයතනික ව්‍යවසායකයෝ (2) ව්‍යාපාර ව්‍යවසායකයෝ

(3) සමාජයීය ව්‍යවසායකයෝ (4) අභ්‍යන්තරික ව්‍යවසායකයෝ

16 ගමේ ප්‍රජා ශාලා ගොඩනැගිල්ලට මුල්ගල තැබීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ ප්‍රදේශයේ පවත්වාගෙන යන ලක්ප්‍රිය ගොසරියේ අතිකරු වූ ලක්ෂමන් ප්‍රියශාන්ත ව්‍යාපාරික මහතාය. එම අවස්ථාව අපට කිව හැක්කේ කුමන ප්‍රතිලාභයක් වශයෙන් ද?

(1) කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම.

(2) ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකි වීම.

(3) ස්වකීය දෛවය තමා මතම රඳාපැවතීම.

(4) නිදහස හා ඉතා ඉහළ තෘප්තියකට පත්වීම.

17 ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයක් විය නොහැක්කේ,

(1) රැකියා අවස්ථා ජනනය කිරීම.

(2) ප්‍රාදේශීය සංවර්ධනය සිදුවීම.

(3) දේශීය සම්පත් උපයෝජනය කිරීම.

(4) නිදහස තුළින් ඉතා ඉහළ තෘප්තියකට පත්වීම.

18 වැඩි වශයෙන් ව්‍යවසායකයින් බිහිවීමට පදනම සපයන ව්‍යාපාර වර්ගය වනුයේ කුඩා ව්‍යාපාරය. කුඩා ව්‍යාපාර බිහිවීමට බලපාන වැදගත් කරුණක් වන්නේ,

(1) රජයේ උදව් උපකාර ලැබිය හැකි වීමයි.

(2) වෙළඳපල හිදැස හඳුනාගෙන ව්‍යාපාර අවස්ථා සඳහා පිවිසිය හැකි වීමයි.

(3) ව්‍යාපාරය කරගෙන යෑමේ දී තීරණ ගැනීමට ඇති පහසුවයි.

(4) පෙළඹවීමේ හා බලපෑම් කිරීමේ හැකියාව වැඩිවීමයි.

19 කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතුවක් විය නොහැක්කේ,

(1) මූල්‍ය කටයුතු පාලනය දුර්වල වීම.

(2) තරගකාරීත්වයට මුහුණ දීමට අපහසු වීම.

(3) යහපත් මානව සම්බන්ධතා පවත්වා ගැනීම.

(4) බොහෝ ව්‍යාපාරිකයින් ව්‍යවසායකයකු ලෙස නොසිතීම.

20 ව්‍යවසායකයින් කාර්ය ඉටුකර ගැනීමේ දී සේවකයන් මෙහෙයවීම සිදුකරනු ලබනුයේ කුමන භූමිකාවක් යටතේ ද?

(1) අයිතිකරුගේ භූමිකාව යටතේ (2) නායකයාගේ භූමිකාව යටතේ

(3) කළමනාකරුගේ භූමිකාව යටතේ (4) සියලු භූමිකා යටතේ

21 ව්‍යාපාර පරිසරය ගැන සැලකීමේ දී නූතන ව්‍යාපාර පරිසරයේ අතීතයේ පැවැති ව්‍යාපාර පරිසරයට වඩා ප්‍රබල වෙනස්කම් රාශියක් දැකිය හැකිවේ. ඒ අනුව අතීත ව්‍යාපාර පරිසරයේ දැකිය හැකි කරුණක් වනුයේ,

(1) අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ වී ඇත.

(2) අවශ්‍යතාවක් සපුරාගැනීම සඳහා ඇති භාණ්ඩ හා සේවා රාශියකි.

(3) තරගකාරීත්වය වැඩිය.

(4) ව්‍යාපාරිකයෝ බලවත් වී ඇත.

22 ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් වනුයේ,

(1) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ, තාක්ෂණික පරිසරය

(2) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ, සම්පත්

(3) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, ප්‍රජා පරිසරය, සම්පත්

(4) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ, ගෝලීය පරිසරය

23 ආයතනයක ඇති අභ්‍යන්තර පරිසර සාධක තුළින් අනාවරණය කළ හැකි වන්නේ,

(1) ශක්තීන් හා දුර්වලතාය (2) අවස්ථා හා තර්ජනය

(3) ශක්තීන් හා අවස්ථාය (4) අවස්ථා හා දුර්වලතාය

24 ආර්ථික පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් වනුයේ,

(1) පොලී අනුපාතිකය, මිල මට්ටම්වල වෙනස්වීම, ළමා ජනගහනය, වැටුප් මට්ටම

(2) පොලී අනුපාතිකය, මිල මට්ටම්වල වෙනස්වීම, විද්‍යාත්මක හා තාක්ෂණික ක්‍රම, විදේශ විනිමය අනුපාතය

(3) විදේශ විනිමය අනුපාතය, පොලී අනුපාතිකය, මිල මට්ටම්වල වෙනස්වීම, සේවා නියුක්තිය

(4) විදේශ විනිමය අනුපාතය, පොලී අනුපාතිකය, ළමා ජනගහනය, වැටුප් මට්ටම

25 රටක් අන්තර් ජාතික වෙළඳ ගිවිසුම්වලට එළඹුනු බව පවසා සිටී. මෙම අන්තර් ජාතික වෙළඳ ගිවිසුම් යන්න අයත්වන පරිසර සාධකය වනුයේ,

(1) ස්වභාවික පරිසරයට (2) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරයට

(3) ආර්ථික පරිසරයට (4) දේශපාලන හා නෛතික පරිසරයට

## II - කොටස

(ල. 50)

- **ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 නිම්නා කෘෂි විද්‍යා අංශයෙන් උසස් පෙළ හදාරා අවසන් කළ යුවතියකි. උසස් පෙළ කරන අතර තුරද පැළ තවානක් පිළිබඳ සිහින මැවූ නිම්නා උසස් පෙළ ලියා අවසන් කළ සැනින්ම පැළ තවානක් ඇරඹීමට අත ගැසීය. ඒ සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම හා අවශ්‍ය කටයුතු සම්පාදනයට සහය දැක්වීම ඇයගේ පියා අතින් ඉටුවිය.

අධ්‍යාපනයෙන් ලත් දැනුමත්, නිබඳ කරනු ලබන සැලකිලිත් නිසා විවිධ පැළ වලින් සමන්විත වූ "නිම්නාගේ හරිත උයන" කොළ පාටින් බබලයි. නිකමට වුවත් හරිත උයනට ගොඩවන සෑම අයකුම ඉන් පිටවනුයේ පැළ දෙක තුනක් මිලදී ගැනීමෙන් අනතුරුවය. නිම්නා ඇයගේ පැළ තවානෙන් ඉවත් කරන කළු පොලිතින් කවර ප්‍රතිචක්‍රීයකරණය කර වාඩිවීම සඳහා බංකු සෑදීමට ක්‍රමයක් යොදාගෙන ඇති අතර පැල සඳහා යොදන ජලයේ වැඩි කොටස ක්‍රමවත්ව ගලායෑමට සලස්වා ජලය අවශ්‍ය කොහිල, කන්කුන් වනි භෝග වගාව සඳහා යොදාගෙන ඇත.

(1) නිම්නාගේ චරිතය ඇසුරින් ව්‍යවසායකත්වය පිළිබඳ ඔබ හඳුනාගත් ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(2) ව්‍යවසායකයාට තම අදහස් ක්‍රියාකාරී බවට පත්කිරීමේ දී විවිධ ගති ලක්ෂණ ඉස්මතුවේ. එවැනි ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හතරක් ලියන්න. (ල. 02)

(3) සෑම පුද්ගලයකුම නිර්මාණශීලී වේ. මෙම නිර්මාණශීලීත්වය සෑම අයකුම ක්‍රියාවට ගන්නේ නැත. ඔබ නිර්මාණශීලීත්වය යනු කුමක්දැයි හඳුන්වා දෙන්න. ( ල . 02)

(4) නිම්නාගේ ව්‍යාපාරයේ පරිසරය සම්බන්ධයෙන් ඇතිවිය හැකි ගැටලු මොනවා ද? ඒ ගැටලු සඳහා ඇය ලබා ඇති විසඳුම් මොනවා ද? ඔබ ඒ සඳහා දෙන විසඳුම බැගින් ලියන්න.

| ගැටලුව | ලබා ඇති විසඳුම් |
|---|---|
| | |
| | |

(2 x 2 = 04)

02 (1) ඔබේ පාසල් පරිසරයේ හමුවිය හැකි විවිධ ගැටලු 5 ක් දක්වන්න. එම ගැටලු 5 ට විසඳුම් 5 ක් යෝජනා කර දක්වන්න. ( ල .

05)

(2) නවෝත්පාදනය සිදුවන ආකාර 4 ක් සඳහන් කරන්න. එම එක් එක් ආකාර 4 ට නිදසුන බැගින් ලියන්න. ( ල. 04)

(3) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර දෙකක් ලියන්න. ( ල. 01)

03 මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරන ඕනෑම කටයුත්තක් ව්‍යාපාර ලෙස සරලව හැඳින්විය හැකිය. අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමට අවශ්‍ය දේවල් අප ලබාගන්නේ මෙම ව්‍යාපාර වලිනි.

(1) අවශ්‍යතා හා වුවමනා හඳුන්වා දෙන්න.

(2) අවශ්‍යතා හා වුවමනා අතර පවතින වෙනස්කම් දෙක බැගින් ලියන්න.

(3) භාණ්ඩ හා සේවා අතර පවතින සුවිශේෂී ලක්ෂණ පෙන්වා දෙන්න.

(4) අවශ්‍යතා හතරක් දක්වා එම අවශ්‍යතා සපුරාලන ආකාර හතරක් සඳහන් කරන්න.

(5) ව්‍යාපාරවල පවතින ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (2 x 5 = 10)

04 (1) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් හතරක් සඳහන් කරන්න.

(2) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(3) ව්‍යවසායකයින් කෙසේ වර්ග කෙරේදැයි නම් කරන්න.

(4) එසේ වර්ග කර නම් කළ ව්‍යවසායකයින් අතුරින් එක් අයෙක් ගැන හඳුන්වා දෙන්න.

(5) ව්‍යවසායකත්වයට අදාළ ප්‍රකාශ කියවා අදාළ තීරුවේ (✓) ලකුණ යොදන්න.

| | ප්‍රකාශය | එකඟවේ | එකඟ නොවේ | නිශ්චිතව කිව නොහැක |
|---|---|---|---|---|
| 1. | ගනුදෙනු සිදුවීම ව්‍යාපාරවල ලක්ෂණයකි. | | | |
| 2. | මිනිස් අවශ්‍යතා තෘප්තිමත් වන්නේ භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමෙනි. | | | |
| 3. | ව්‍යාපාර කටයුතු ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් ඉටුවේ. | | | |
| 4. | ව්‍යාපාර කටයුතුවල නියැලීම සම්බන්ධව අවදානමක් ඇත. | | | |

(ල. 10)

05 මැල්සිරිපුර ප්‍රදේශයේ පදිංචිකාරියක වන ප්‍රියංකා ජෑම්, කෝඩියල්, චට්නි සහ විවිධ බීම වර්ග පිළියෙල කිරීම පිළිබඳ පාඨමාලාවක් හැදෑරූ යුවතියකි. පලතුරු කාලවලදී තම ප්‍රදේශයේ දිවුල්ගස් යට, අඹගස් යට, දෙහි ගස්යට හැලී හැලී නාස්තිවන ද්‍රව්‍ය උපයෝගී කරගෙන ජෑම්, කෝඩියල්, චට්නි සහ බීම වර්ග නිපදවීම ආරම්භ කරනුයේ මහජන බැංකුවේ ණය මුදලක් ද ලබාගැනීමෙන් පසුවය. රැකියා නොමැති තම යහළු යෙහෙලියන් කිහිප දෙනෙකු ද මේ සඳහා එක් කරගන්නා ලදී.

වර්තමානය වන විට ප්‍රදේශයේ රැකියා නොමැති 35 දෙනෙකුට පමණ රැකියා අවස්ථා ලබාදී ඇති අතර ප්‍රියංකා ඉගෙනගත් ගමේ පාසලේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර දීමට ද කැමැත්ත පල කර ඇත. මැල්සිරිපුර පමණක් නොව අවට නගර කිහිපයකම අලෙවිකර කර රසවිඳින තම නිෂ්පාදන පිළිබඳ ප්‍රියංකා සිහිකරන්නේ ඉතාමත් තුටු සිතිනි.

(1) ව්‍යවසායකයාට ව්‍යවසායකත්වය තුළින් හිමිවන ප්‍රතිලාභ හතරක් ලියන්න.

(2) ඔබ සඳහන් කළ ඉහත පළමු ප්‍රශ්නයේ පිළිතුර ඉහත කියවුනු ප්‍රියංකා නම් ව්‍යවසායිකාවට අදාළ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(3) ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ හතරක් ලියන්න.

(4) ඔබ 3 වන ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර ඉහත ප්‍රියංකා නම් ව්‍යවසායිකාවගේ සිද්ධියට අදාළ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(5) ඔබ රැකියාවක යෙදෙනවාට වඩා ව්‍යවසායකයකු වීම වඩාත් ප්‍රතිලාභදායී බව පැහැදිලි කරන්න. (2 x 5 = 10)

06 නගරයට ආසන්නයේ පදිංචි වී සිටින තුෂාරී ව්‍යාපාර කිරීමට දැඩි ඇල්මක් දක්වන්නියකි. ඇය මිරිස් තුනපහ කුඩුකර පැකට් කිරීමෙන් පසු වෙළඳපොලට සපයා ආදායම් උපයාගැනීමට යොමුවී ඇත. ඇයගේ සැමියා පැකට් කරන ලද මිරිස් තුනපහ වෙළඳපොලට බෙදාහැරීමට ද, මුදල් එකතු කරදීමට ද සහය වේ. ඉතා පිරිසිදු ලෙස ගුණාත්මයෙන් යුතු අළෙවි ද්‍රව්‍ය සපයන නිසා තුෂාරිගේ නිෂ්පාදන සඳහා වෙළඳ පලේ නමක් රැඳවීමට හැකි වී ඇත.

(1) ආර්ථික සංවර්ධනයට තුෂාරිගේ ව්‍යාපාරය වැනි කුඩා ව්‍යාපාරවල දායකත්වය සපයන

The National e-Learning Portal for The General Education